මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல / My No:
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.02.01

## 2023/24 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට, වී ගබඩා හිමිකරුවන්ට සහ වී තොග රැස්කරන්නන් හට පෙබරවාරි 01 දින සිට සහනදායී පොළී අනුපාතයක් යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක්

වී ගොවීන් වෙත සාධාරණ මිලක් ලබාදීමේ අරමුණින් 2023/24 මහ කන්නයේ වී අස්වනු මිලදී ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්, වී ගබඩා හිමිකරුවන් සහ වී තොග රැස්කරන්නන් වෙත සහනදායී පොළී අනුපාතයක් යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් (Pledge Loan Scheme) පෙබරවාරි 01 දින සිට ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව, මෙම ණය යෝජනා ක්‍රමයේ ඉලක්කගත කණ්ඩායම් පහත පරිදි වේ.

- දෛනික වී කෙටීමේ ධාරිතාවය මෙ.ටො.25ක් හෝ ඊට අඩු ප්‍රමාණයක් සහිත සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්
- ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත වී ගබඩා හිමිකරුවන්
- ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත, හෝ ප්‍රමාණවත් ගබඩා පහසුකම් සහිත ගබඩා හිමිකරුවෙකු හෝ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමිකරුවෙකු සමඟ ඇතිකරගන්නා ලද කල්බදු ගිවිසුමක් සහිත වී තොග රැස්කරන්නන්
- අදාළ රාජ්‍ය ආයතනයකින් ලබාගත් ව්‍යාපාර ලියාපදිංචි සහතිකයක් සියලු ණය ඉල්ලුම්කරුවන් සතුව පැවතිය යුතුය.

එක් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියෙකු හට රු.මි.50ක් ද වී ගබඩා හිමිකරුවන්ට සහ වී තොග රැස්කරන්නන් හට රු.මි. 25ක්ද වන උපරිම ණය මුදලක් 15%ක වාර්ෂික පොළී අනුපාතයක් යටතේ ලබාගත හැකිය. ඉන් 11%ක් අදාළ ණය ඉල්ලුම්කරු විසින් දැරිය යුතු අතර ඉතිරි 4% පොළී සහනාධාරයකි. අදාළ ණය මුදල දින 180ක් තුල ගෙවා අවසන් කල යුතුය.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පහත සඳහන් බැංකු හරහා ඔඩපණ ණය නිකුත් කිරීමට සැලසුම් කර ඇත.

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- කොමර්ෂල් බැංකුව
- ඩී එෆ් සී සී බැංකුව
- ජාතික සංවර්ධන බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- සම්පත් බැංකුව
- සණස සංවර්ධන බැංකුව
- සෙලාන් බැංකුව

බැංකු හරහා නිදහස් කිරීමට නියමිත මුළු ණය මුදලේ වටිනාකම රු.මි. 9,000කි.

තවද, මෙම වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන අවම මිලක් යටතේ වී මිලදී ගැනීමට සැලසුම් කර ඇත. 2023/24 මහ කන්නය සඳහා වී කිලෝග්‍රෑමයක මිලදී ගැනීමේ අවම මිල පහත පරිදි වේ.

| වී වර්ගය | තෙතමනය 14%ක් වන සම්මත ප්‍රමිතියේ වී කිලෝග්‍රෑමයක් (රු.) | තෙතමනය 14% වැඩි වන වී කිලෝග්‍රෑමයක් (රු.) |
|---|---|---|
| නාඩු | 105 | 90 |
| සම්බා | 120 | 100 |
| කීරිසම්බා | 130 | 120 |

2024 ජනවාරි 29 දින අමාත්‍ය මණ්ඩලය මගින් ගනු ලැබූ තීරණයකට අනුව ආරම්භ කෙරෙන මෙම ණය යෝජනා ක්‍රමය මෙම වර්ෂයේ පෙබරවාරි 01 දින සිට අප්‍රේල් මස 30 දින දක්වා ක්‍රියාත්මක කෙරේ.